**ශීර්ෂය 167 - විශේෂ කාර්යභාර අමාත්‍යාංශය**

**---------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

විශේෂ කාර්යභාර අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විශේෂ කාර්යභාර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 17 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට විශේෂ කාර්යභාර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂව සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) විශේෂ කාර්යභාර අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශය විසින් නියමිත දිනයට පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන, ගිණුම්, සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**<br>2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එය මාස 02 ක ප්‍රමාදයකින් පසු 2019 මැයි 06 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ගිණුම් තොරතුරු සොයා ගැනීමට අපහසු වීම නිසා මෙම ගිණුම පිළියෙල කිරීම 2018 පෙබරවාරි 28 දිනට අවසන් කිරීමට නොහැකි විය. |
| **(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශය**<br>රජයේ නිලධාරින්ට | විධිවිධාන ප්‍රකාරව සැසඳුම් ප්‍රකාශ විගණනයට | -එම- |

| | |
|---|---|
| අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, 2019 ජුනි 20 දින වනවිටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවීම. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂ අනුව මගී වාහන රු.186,370,094 ක ශේෂයක් දක්වා තිබුණ ද රාජ්‍ය වත්කම් තක්සේරු කිරීම් හා ගිණුම්ගත කිරීම ගොනුවේ රු.109,450,000 ක වටිනාකමක් දක්වා තිබුණි. ඒ අනුව රු.76,920,094 ක වෙනසක් නිරීක්ෂණය විය. | වත්කම් නිවැරදි අගයට ගිණුම්ගත කළ යුතුවීම. | එම අගයෙහි දෝෂයක් වේ නම් ඉදිරියේදී ඒවා නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කිරීමේ පදනමින් මූල්‍ය ප්‍රකාශනවලට භාණ්ඩාගාර පිටපත් අනුව ගිණුම් ගත කර ඇති අගයන් ඇතුලත් කරන ලදී. |

**(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව ආදායම් නොවන ලැබීම් රු.33,757,456 ක් දක්වා තිබුණ ද මාසික ගිණුම් සාරාංශ හා අනිකුත් තොරතුරු අනුව එය රු.32,717,179 ක් වූයෙන් රු.1,040,277 ක වෙනසක් | ආදායම් නොවන ලැබීම් නිවැරදිව දැක්විය යුතුවීම. | මුදලින් ලද ආදායම් නොවන ලැබීම් භාණ්ඩාගාර පොත් හා මාසික ගිණුම් සාරාංශ අනුව නිවැරදි වේ. |

| | | | |
|---|---|---|---|
| | විය. | | |
| (ii) | තැන්පතු ලැබීම් රු.113,640 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ ඇතුළත් කර නොතිබුණි. | ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය නිවැරදිව දැක්විය යුතුවීම. | මෙම කරුණු හා එකඟ විය නොහැක. තැන්පතු ලැබීම්වලට අදාල රු.113,640 ක මුදල ආදායම් නොවන ලැබීම් වේ. |
| (iii) | මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයේ වටිනාකම හා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව රු.2,162,450 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙහෙයුම් ක්‍රියාකාරකම් හා ආයෝජන ක්‍රියාකාරකම් නිවැරදිව දැක්විය යුතුවීම. | විගණනයේදී නිරීක්ෂණය වූ පරිදි රු.2,162,450 ක වෙනසක් නැත. |
| (iv) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් කිසිවක් නොමැති වුවත් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව රු.5,768,519 ක අත්තිකාරම් ආපසු අයකර ගැනීම් තිබුණි. | අත්තිකාරම් ආපසු අයකර ගැනීම (හරස් සටහන් ද සමඟ) ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ලෙස දැක්විය යුතුය. | එකී වියදම් ගිණුමට අදාලව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් නොවිය යුතු අතර එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුලත් කර ඇත. |
| (v) | ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැයකළ මුදල් රු.65,014 ක් ලෙස දක්වා තිබුණ ද ඉදිරිපත් කළ තොරතුරු අනුව එකී වියදමට අමතරව අත්තිකාරම් ගෙවීම් රු.7,194,182 ක් විය. | ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කිරීම් නිවැරදිව දැක්විය යුතුවීම. | ඔබ විසින් පෙන්වා දී ඇති අත්තිකාරම් ගිණුම් අගය නිවැරදි නොවේ. |
| (vi) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව මුදල්වල ශුද්ධ වෙනස්වීම් රු.189,850 ක් ලෙස දක්වා තිබුණ ද මුදල්වල ශුද්ධ වෙනස්වීමක් නිරීක්ෂණය නොවිය. | මුදල් වල ශුද්ධ වෙනස්වීම නිවැරදිව දැක්විය යුතුවීම. | එහි වෙනසට හේතුව ඉහත ජ'නල් සටහනේ රු.189,850 ක මුදල 167011 ට බැර කර ඇති නිසාය. සත්‍ය වශයෙන් නොවුනද එය මුදල්වල ශුද්ධ වෙනස්වීමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වේ. |

## 1.6.3. විගණන සාක්ෂි නොවීම

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------ | ----------------------------------- |
| (i) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිවෙළින් රු.8,015,792 ක් හා රු.3,913,585 ක් වෙනත් අමාත්‍යාංශයකට මාරුකර තිබුණ ද වත්කම් මාරු කිරීම් තහවුරු කරන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | වත්කම් මාරු කිරීමට අදාළ ලිපි ලේඛන නිසි පරිදි පවත්වාගෙන යා යුතුවීම. | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ ශේෂයට අදාල වත්කම් මාරු කරන ලද්දේ විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට වන අතර ඊට අදාල ලැබීම් නියෝග එවකට සිටි ප්‍රධාන ගණකාධිකාරී විසින් ලබා දී ඇත. |